# අමාත්‍ය මණ්ඩල කාර්යාලය

# කාර්යසාධන වාර්තාව

# 2017

ජනරජ ගොඩනැගිල්ල, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ - 01.

www.cabinetoffice.gov.lk

# අමාත්‍ය මණ්ඩල කාර්යාලය



"ජනරජයේ පාලනය මෙහෙයවීම සඳහා විධායකයට සහාය වන විශ්වසනීයතම රාජ්‍ය ආයතනය වීම"

# පෙළ ගැස්ම


## 1. හැඳින්වීම

1.1 දැක්ම

1.2 මෙහෙවර

1.3 අරමුණු

1.4 ක්‍රියාකාරකම්

## 2. අමාත්‍ය මණ්ඩල කාර්යාලය හා එහි කාර්යභාරය

2.1 අමාත්‍ය මණ්ඩල රැස්වීම්වලට අදාළ කර්තව්‍යයන්

2.2 අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවලට අදාළ කටයුතු

2.3 විවිධ විෂයන් සම්බන්ධයෙන් අධ්‍යයනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන නිලධාරි කමිටුවලට අදාළ කර්තව්‍යයන්

2.4 අතිගරු ජනාධිපතිතුමා හෝ අමාත්‍ය මණ්ඩලය හෝ විසින් පවරනු ලබන විශේෂිත රාජකාරි

2.5 අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙන අමාත්‍ය මණ්ඩල සංදේශ හා විවිධ වාර්තා පිළියෙල කිරීම පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කිරීම

2.6 විශේෂ අවධානය යොමු විය යුතු අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු

2.7 අමාත්‍යාංශ හා අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සමීප සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම

## 3. අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ එක් එක් අංශයන්ට පැවරී ඇති කාර්යභාරයන්

3.1 සංදේශ අංශය

3.2 වාර්තා සම්පාදන හා භාෂා පරිවර්තන අංශය

3.3 පරිගණක සේවා අංශය

3.4 ආයතන හා සේවා සැපයුම් අංශය

3.5 ගිණුම් අංශය

## 4. 2017 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්යසාධනය

4.1 අමාත්‍ය මණ්ඩල රැස්වීම් සම්බන්ධයෙන් වූ කර්තව්‍යයන්

4.2 අමාත්‍ය මණ්ඩල කාරක සභා/අනුකාරක සභාවලට අදාළ කටයුතු

4.3 විවිධ විෂයයන් සම්බන්ධයෙන් අධ්‍යයනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන නිලධාරි කමිටුවලට අදාළ කටයුතු

4.4 උපරිමාධිකරණයන්හි විභාගයට ගැනෙමින් පවතින නඩු කටයුතු සඳහා අවශ්‍ය වන තොරතුරු සහ අමාත්‍ය මණ්ඩල තීරණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

4.5 2017 වසර තුළ සිදු කරන ලද විශේෂයෙන් සඳහන් කළ යුතු කාර්යභාරයන්.

## 5. අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්යභාරයේ විශේෂත්වය

## 6. මානව සම්පත් කළමනාකරණය

6.1 2017-12-31 දිනට සේවක සංඛ්‍යා තොරතුරු

6.2 2017-12-31 දිනට සිටි කාර්ය මණ්ඩලය

6.3 2017 වසර තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ සේවයට අලුතින් එක් වූ සේවක මහත්ම / මහත්මීන්

6.4 විශ්‍රාම ගැනීම්

6.5 ස්ථාන මාරුවීම්

6.6 පුහුණුව හා සංවර්ධනය

## 7. මූල්‍ය හා ගිණුම් කටයුතු සමාලෝචනය

7.1 ඇස්තමේන්තු

7.2 නිලධාරීන් සඳහා ණය අත්තිකාරම් ලබා දීම

7.3 වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම

7.4 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම

7.5 විගණන විමසුම්

# <u>ඇමුණුම්</u>

| | | |
|---|---|---|
| **ඇමුණුම I** | - | 2017-01-01 දින සිට 2017-12-31 දින දක්වා අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව |
| **ඇමුණුම II(අ)** | - | අමාත්‍ය මණ්ඩල සාමාජික ලැයිස්තුව - 2017-01-01 සිට 2017-05-22 දක්වා |
| **ඇමුණුම II(ආ)** | - | අමාත්‍ය මණ්ඩල සාමාජික ලැයිස්තුව - 2017-05-23 සිට 2017-12-31 දක්වා |
| **ඇමුණුම** III | - | අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ 2017 වර්ෂයේ විසර්ජන ගිණුම |
| **ඇමුණුම** IV | - | අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ 2017 වර්ෂයේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ලබා දීමට අදාළ 'බී' ගිණුම - සැසඳුම් ප්‍රකාශය |

# අමාත්‍ය මණ්ඩල කාර්යාලය
# කාර්යසාධන වාර්තාව - 2017

## 1. හැඳින්වීම

### 1.1 දැක්ම

ජනරජයේ පාලනය මෙහෙයවීම සඳහා විධායකයට සහාය වන වඩාත් විශ්වසනීයතම රාජ්‍ය ආයතනය වීම.

### 1.2 මෙහෙවර

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 42 වන ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාව ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී ඇති ජනරජයේ ආණ්ඩුවේ පාලනය මෙහෙයවීමට සහ ඒ පිළිබඳ විධානයට අදාළ තීරණ ගැනීමේ ක්‍රියාවලියට අවශ්‍ය සියලුම සහායයන් කාර්යක්ෂම ලෙස ලබා දීම.

### 1.3 අරමුණු

අමාත්‍ය මණ්ඩල සංදේශ මඟින් ඉදිරිපත් කෙරෙන යෝජනා සම්බන්ධයෙනුත්, අමාත්‍ය මණ්ඩලයේ අවධානය යොමු වන වෙනත් වැදගත් කරුණු සම්බන්ධයෙනුත්, ඒවායේ ප්‍රතිපත්තිමය හා නෛතික සංකූලතා පිළිබඳ මනා අවබෝධයෙන් යුතුව ජාතියේ හිත පිණිස යෝග්‍යතම තීරණයන්ට එළඹිය හැකි වනු පිණිස අමාත්‍ය මණ්ඩලයට හා අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවලට උපරිම අයුරින් අවශ්‍ය සහාය ලබා දීම.

### 1.4 ක්‍රියාකාරකම්

(i) ඉදිරිපත් කරනු ලැබ ඇති අමාත්‍ය මණ්ඩල සංදේශ සම්බන්ධයෙන් අදාළ අමාත්‍යවරුන්ගෙන් නිරීක්ෂණ ලබාගැනීම.

(ii) අමාත්‍ය මණ්ඩල සංදේශ පරීක්ෂා කිරීමෙන් පසුව අමාත්‍ය මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍රය සකස් කිරීම.

(iii) අමාත්‍ය මණ්ඩලයේ සහ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය සියලු සහාය සේවාවන් සැලසීම.

(iv) අමාත්‍ය මණ්ඩල සංදේශ ඒවාට අදාළ නිරීක්ෂණ සමඟ සලකා බැලීම පිණිස අමාත්‍ය මණ්ඩලය වෙත සහ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා වෙත ඉදිරිපත් කිරීම.

(v) ජනරජයේ ආණ්ඩුවේ පාලනය මෙහෙයවීම හා ඒ පාලනය පිළිබඳව විධානය සහ ප්‍රතිපත්ති සම්පාදනය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමේදී අමාත්‍ය මණ්ඩලයටත්, අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවන්ටත්, අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳව නිරවුල්ව හා අදාළ සියලු කරුණු පිළිබඳ නිසි අවබෝධයෙන් යුතුව තීරණ ගැනීමට පහසු වන පරිදි, එම සංදේශ පිළිබඳව නෛතික හා ප්‍රතිපත්තිමය සංකූලතා ගැඹුරින් අධ්‍යයනය කර අතිගරු ජනාධිපතිතුමා වෙතත්, අමාත්‍ය මණ්ඩලය වෙතත්, අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවන් වෙතත් කරුණු ඉදිරිපත් කිරීම.

(vi) සංදේශය ඉදිරිපත් කළ අමාත්‍යාංශය විසින් පමණක් නොව එම සංදේශයේ සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීමට විවිධ අයුරින් සම්බන්ධ වන ආයතන හෝ බලධරයන් විසින් ඉටු කළ යුතු කාර්යභාරය පිළිබඳව දැනුම්වත් වීම පහසු වන පරිදි අවශ්‍ය විස්තරද ඇතුළත් කරමින් අමාත්ය මණ්ඩල රැස්වීම්වල සහ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා රැස්වීම්වල තීරණ භාෂාත්‍රයෙන්ම (සිංහල/දෙමළ හා ඉංග්‍රීසි) සකස් කිරීම (එක් වරම සිංහල/දෙමළ භාෂාවන්ට පරිවර්තනය කිරීම පහසු කිරීම සඳහා ඉංග්‍රීසි පිටපත මුලින් සකස් කරනු ලැබේ.) එකී තීරණ ඇතුළත් වාර්තා ගරු අමාත්‍යවරුන් වෙතත්, අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් සහ වෙනත් ආයතන හෝ බලධරයන් වෙතත් යොමු කිරීම.

(vii) විශේෂ අවධානය යොමු විය යුතු නිශ්චිත අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසු විපරම් කටයුතු කිරීම.

(viii) අමාත්‍ය මණ්ඩල තීරණයන්ට එරෙහිව හෝ වෙනත් අයුරකින් අමාත්‍ය මණ්ඩලය වගඋත්තරකරුවන් ලෙස දක්වමින් පවරා ඇති නීති කෘත්‍යයන් සම්බන්ධයෙන් අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා සම්ප්‍රකාශ පිළිබඳ නිරීක්ෂණ සහ වෙනත් තොරතුරු නීතිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම.

(ix) අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම පිළිබඳ උපදෙස් වරින් වර අමාත්‍යාංශ වෙත නිකුත් කිරීම හා ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරුන්ට හා ජ්‍යෙෂ්ඨ නිලධාරින්ට මහපෙන්වීම සහ පැහැදිලි කිරීම් ඔවුන් වෙත ලබා දීම.

(x) අතිගරු ජනාධිපතිතුමාගේ හෝ අමාත්‍ය මණ්ඩලයේ හෝ නියමයන් මත පැවරෙන වෙනත් කවර හෝ කාර්යයන් ඉටු කිරීම.

## 2. අමාත්‍ය මණ්ඩල කාර්යාලය හා එහි කාර්යභාරය

ජනරජයේ ආණ්ඩුවේ පාලනය මෙහෙයවීම හා ඒ පාලනය පිළිබඳ විධානයට අදාළව අමාත්‍ය මණ්ඩලය වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී ඇති කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය සහාය සේවාවන් සැපයීම පිණිස අමාත්‍ය මණ්ඩල කාර්යාලය ස්ථාපිත කරනු ලැබ ඇත.

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 50 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ප්‍රධානියා වශයෙන් කටයුතු කරයි.

අතිගරු ජනාධිපතිතුමාගේ විධානයන්ට යටත්ව, අතිගරු ජනාධිපතිතුමා විසින් හෝ අමාත්‍ය මණ්ඩලය විසින් හෝ පවරනු ලබන්නා වූ කර්තව්‍යයන් සහ කාර්යය ඉටු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාට සහාය වීම මෙම කාර්යාලයේ වගකීම වේ.

ඒ අනුව, අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කර්තව්‍යයන් ප්‍රධාන වශයෙන් පහත පරිදි දැක්විය හැකිය:

### 2.1 අමාත්‍ය මණ්ඩල රැස්වීම්වලට අදාළ කර්තව්‍යයන්:

2.1.1 අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා ඒ ඒ අමාත්‍යාංශ විසින් මෙම කාර්යාලය වෙත යොමු කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ, අමාත්‍ය මණ්ඩල අනුකමිටු වාර්තා, අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල කාර්යසාධන වාර්තා හා රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල වාර්ෂික වාර්තා හා ගිණුම්, නියමිත මාර්ගෝපදේශයන්ට හා එකී කාර්යය සඳහා අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් නිකුත් කරනු ලැබ ඇති උපදෙස්වලට අනුකූලව ඉදිරිපත් කර තිබේදැයි පරීක්ෂා කර බලා, එම ලේඛන මෙම කාර්යාලය විසින් භාර ගනු ලැබේ.

2.1.2 මෙසේ භාර ගනු ලබන සෑම අමාත්‍ය මණ්ඩල සංදේශයකටම අනන්‍ය වූ අංකයක් ලබා දෙන අතර, එක් එක් සංදේශය සඳහා ලබා දෙන එම අංකය යටතේ එම සංදේශ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ලියාපදිංචි කරනු ලැබේ. එසේ ලියාපදිංචි කරනු ලැබූ අමාත්‍ය මණ්ඩල සංදේශ අදාළ වන පරිදි, නිරීක්ෂණ ලබාගැනීම සඳහා ගරු අමාත්‍යවරුන් වෙත යොමු කෙරේ.

2.1.3 සතිපතා අඟහරුවාදා පැවැත්වෙන අමාත්‍ය මණ්ඩල රැස්වීම සඳහා වන න්‍යාය පත්‍රය සතියේ බදාදා වන විට සකස් කර අවසන් කරනු ලබන අතර, එම න්‍යාය පත්‍රය, මීළඟ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සාකච්ඡාවට ගනු ලැබීමට නියමිත අමාත්‍ය මණ්ඩල සංදේශ ඇතුළත් ගොනුව හා කලින් සතියේ පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේ කෙටුම්පත් වාර්තාව සමඟ සිකුරාදා වන විට ගරු අමාත්‍යවරුන් වෙත ගෙන ගොස් භාර දෙනු ලැබේ.

2.1.4 එළඹෙන සතියට නියමිත අමාත්‍ය මණ්ඩල සංදේශ ගරු අමාත්‍යවරුන් වෙත භාර දීමෙන් අනතුරුව, අමාත්‍ය මණ්ඩල රැස්වීම පැවැත්වීමට නියමිත දිනය දක්වා ඒ ඒ අමාත්‍යාංශ විසින් අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ අතුරින්, සුවිශේෂ තත්ත්වයන් යටතේ, අමාත්‍ය මණ්ඩලය විසින් නොපමාව සලකා බැලිය යුතු යයි සලකනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ ඇතුළත් කර අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව පරිපූරක න්‍යාය පත්‍රයක් සකස් කොට එකී න්‍යායපත්‍රය හා අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ අමාත්‍ය මණ්ඩලයේ සලකා බැලීම පිණිස අමාත්‍ය මණ්ඩල රැස්වීම ආරම්භ වීමට පෙර ඉදිරිපත් කරනු ලැබේ.

2.1.5 එසේම විෂය භාර ගරු අමාත්‍යවරුන් විසින් අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතියට යටත්ව, විශේෂිත හා හදිසි කරුණු යටතේ වන අමාත්‍ය මණ්ඩල සංදේශ අමාත්‍ය මණ්ඩල රැස්වීම පැවැත්වෙන අවස්ථාවේදී අමාත්‍ය මණ්ඩලයේ සලකා බැලීම සඳහා සභාගත කරනු ලැබේ.

2.1.6 ඉහත 2.1.3හි සඳහන් සියලුම අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳව නිරවුල්ව හා අදාළ සියලු කරුණු පිළිබඳ නිසි අවබෝධයකින් යුතුව තීරණ ගැනීම පහසු වන පරිදි, එම සංදේශ පිළිබඳව නෛතික හා ප්‍රතිපත්තිමය සංකූලතා ගැඹුරින් අධ්‍යයනය කර අමාත්‍ය මණ්ඩලයටත්, අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවන්ටත් කරුණු ඉදිරිපත් කිරීම අමාත්‍ය මණ්ඩල ලේකම්වරයා විසින් සිදු කරන අතර ඒ සඳහා සහාය වීම මෙම කාර්යාලයෙන් ඉටු වන එක් වැදගත් කර්තව්‍යයකි.

2.1.7 අමාත්‍ය මණ්ඩල රැස්වීම පැවැත්වීමෙන් අනතුරුව, අමාත්‍ය මණ්ඩල ප්‍රකාශක ගරු අමාත්‍යවරයා විසින් රටේ ජනතාව විසින් දැනගත යුතු වැදගත් අමාත්‍ය මණ්ඩල තීරණ ලෙස හඳුනාගනු ලබන අමාත්‍ය මණ්ඩල තීරණ ඇතුළත් වාර්තාවක් එදිනම සකස් කොට එය ජනමාධ්‍ය වෙත නිකුත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ සම-ප්‍රකාශකවරුන් වශයෙන් කටයුතු කරනු ලබන ගරු අමාත්‍යතුමන්ලා වෙත වහාම යොමු කෙරේ. (කෙසේ වුවද, ඊළඟ සතියේ පැවැත්වෙන අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සම්මත කිරීමෙන් අනතුරුව පමණක් ක්‍රියාත්මක කළ යුතුව ඇති ඇතැම් අමාත්‍ය මණ්ඩල තීරණ සහ එම රැස්වීමේදී සංශෝධනය වීමට ඉඩ ඇතැයි සිතිය හැකි තීරණද එම වාර්තාවට ඇතුළත් නොකෙරේ).

2.1.8 ඒ ඒ අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරනු ලබන සංදේශ පිළිබඳව අමාත්‍ය මණ්ඩලය විසින් එළඹෙන තීරණ අතුරින් වහා කටයුතු කළ යුතු යැයි අදහස් කරනු ලබන විෂයයන්ට අදාළ කෙටුම්පත් තීරණ එදිනම ඉතා ඉක්මනින් ෆැක්ස් මගින් අදාළ අමාත්‍යාංශ වෙත යවනු ලැබේ.

2.1.9 අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණ ඇතුළත් කොට අමාත්‍ය මණ්ඩල රැස්වීමේ වාර්තාව සකස් කිරීමේ කටයුතු අමාත්‍ය මණ්ඩල රැස්වීම අවසන් වූ වහාම ආරම්භ කෙරෙන අතර, එය භාෂාත්‍රයෙන්ම සකස් කෙරේ. (දෙමළ පරිවර්තනය සකස් කිරීම ප්‍රමාද වීම වැළැක්වීම සඳහා මුලින්ම ඉංග්‍රීසි පිටපත සකස් කරනු ලැබේ.)

2.1.10 මීළඟ සතියේ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍රය හා එයට ඇතුළත් අමාත්‍ය මණ්ඩල සංදේශ ගොනුව, එළැඹෙන සිකුරාදා හෝ ඊට පෙර ලැබෙන සේ ගරු අමාත්‍යවරුන් වෙත ගෙන ගොස් භාර දෙනු ලැබේ.

2.1.11 මීළඟට පැවැත්වෙන රැස්වීමේදී අමාත්‍ය මණ්ඩලය විසින් සම්මත කිරීමෙන් අනතුරුව කලින් සතියේ පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණ අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් භාෂාත්‍රයෙන්ම සකස් කර, එකී තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරෙන අදාළ අමාත්‍යාංශ සහ වෙනත් රාජ්‍ය ආයතන වෙත යවනු ලැබේ.

## 2.2 අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවලට අදාළ කටයුතු:

එක් එක් විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ගරු අමාත්‍යවරුන් විසින් සාමාන්‍යයෙන් තනි තනිව හෝ ඇතැම්විට ඒකාබද්ධව සංදේශ ලෙස ඉදිරිපත් කරනු ලබන යෝජනා පිළිබඳව, ප්‍රථම කොට, අවශ්‍ය පරිදි, ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධරයන්ගේද සහාය ඇතිව, ගැඹුරින් අධ්‍යයනය කොට, අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමට හැකි වනු පිණිස ඒ ඒ විෂයට අදාළ වන පරිදි ගරු අමාත්‍යවරුන්ගෙන් සමන්විත අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා අමාත්‍ය මණ්ඩල තීරණ මඟින් පිහිටුවා ඇත. එකී අනුකාරක සභාවන්හි කටයුතු සම්බන්ධීකරණය කිරීමත්, විශේෂයෙන්ම ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවට අදාළ කටයුතු සිදු කිරීමත් අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත පැවරී තිබෙන කර්තව්‍යයන් වේ.

## 2.3 විවිධ විෂයයන් සම්බන්ධයෙන් අධ්‍යයනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන නිලධාරි කමිටුවලට අදාළ කර්තව්‍යයන්:

අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙන අමාත්‍ය මණ්ඩල සංදේශවලට අදාළ කරුණු පිළිබඳව වැඩිදුරටත් අධ්‍යයනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පත් කරනු ලබන නිලධාරි කමිටු සමඟ සම්බන්ධීකරණය කොට අදාළ වාර්තා නියමිත දිනට ලබාගැනීමෙන් අනතුරුව, අමාත්‍ය මණ්ඩලයේ සලකා බැලීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත පැවරී ඇති වගකීමකි.

**2.4 අතිගරු ජනාධිපතිතුමා හෝ අමාත්‍ය මණ්ඩලය හෝ විසින් පවරනු ලබන විශේෂිත රාජකාරි:**

අතිගරු ජනාධිපතිතුමා විසින් සහ අමාත්‍ය මණ්ඩලය විසින් අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා වෙත කලින් කලට පවරනු ලබන විශේෂ රාජකාරිවලට අදාළ කර්තව්‍යයන් සහ වගකීම් කඩිනමින් ඉටු කිරීම සඳහා අවශ්‍ය සහාය අමාත්‍ය මණ්ඩල ලේකම්වරයා වෙත ලබා දීමද අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කර්තව්‍යයකි.

**2.5 අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙන අමාත්‍ය මණ්ඩල සංදේශ හා විවිධ වාර්තා පිළියෙල කිරීම සම්බන්ධයෙන් මාර්ගෝපදේශ නිකුත් කිරීම:**

අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම හා එම සංදේශ අමාත්‍ය මණ්ඩලය කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අදාළ වන මාර්ගෝපදේශ හා උපදෙස් කලින් කලට නිකුත් කිරීම අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ වගකීමක් වේ.

**2.6 විශේෂ අවධානය යොමු විය යුතු අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු:**

අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ පදනම් කරගෙන අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලබන තීරණ අතුරින් සුවිශේෂ වැදගත්කමකින් යුත් තීරණ ඒ ආකාරයෙන්ම නියමිත කාලවකවානු තුළදී ක්‍රියාත්මක වන බව තහවුරු කරගැනීමේ අරමුණින් හා එම තීරණ ක්‍රියාත්මක කිරීමේදී පැන නැඟෙන ගැටලු කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයේ අවධානය යොමු කිරීමේ අරමුණින් අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් එකී තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසු විපරම් කටයුතු කරනු ලබයි.

**2.7 අමාත්‍යාංශ හා අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සමීප සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම:**

අමාත්‍ය මණ්ඩලයේ කාර්යයන්ට අදාළ කරුණු සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් කාර්යාලය, මුදල් අමාත්‍යාංශය හා අනෙකුත් සියලුම අමාත්‍යාංශ සහ රජයේ ආයතන සමඟ මෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව සහ නීතිපති දෙපාර්තමේන්තුව වැනි ආයතන සමඟද සමීප සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් කරනු ලබයි.

## 3. අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ එක් එක් අංශයන් වෙත පැවරී ඇති කාර්යභාරයන්:

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කටයුතු පහසුවෙන් ඉටු කරගැනීම සඳහා කාර්යාලය තුළ පහත සඳහන් පරිදි අංශ කිහිපයක් ස්ථාපිත කර ඇති අතර, එකී අංශවලට අදාළ රාජකාරි පවරා වඩා ඵලදායී හා කාර්යක්ෂම ලෙස ඉටු කරගැනීම පිණිස පියවර ගෙන ඇත.

### 3.1 සංදේශ අංශය:

පහත සඳහන් කර්තව්‍යයන් මෙම අංශය වෙත පැවරී ඇත:

(i) විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳව මූලික පරීක්ෂාවකින් අනතුරුව එක් එක් අමාත්‍යාංශ වෙත වෙන් කර දී ඇති අංක යටතේ එම සංදේශ ලියාපදිංචි කිරීම.

(ii) ලියාපදිංචි කෙරුණු අමාත්‍ය මණ්ඩල සංදේශ/සටහන් පිළිබඳ මූලික අධ්‍යයනයකින් පසුව හා න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඉදිරිපත් කිරීමට පෙර, එම සංදේශවල සඳහන් යෝජනා සෘජුවම අදාළ වන අමාත්‍යාංශවල ගරු අමාත්‍යවරුන්ගේ නිරීක්ෂණ ලබාගැනීම සඳහා යොමු කිරීම.

(iii) අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ උපදෙස් හා මඟපෙන්වීම මත අමාත්‍ය මණ්ඩල රැස්වීම් හා අනුකාරක සභා රැස්වීම් සඳහා වන න්‍යාය පත්‍ර සහ පරිපූරක න්‍යාය පත්‍ර පිළියෙල කිරීම.

(iv) ගරු අමාත්‍යවරුන්ගේ පහසු විමර්ශනය සඳහා, භාෂාත්‍රයෙන් පිළියෙල කරනු ලබන පෙර රැස්වීමෙහි කෙටුම්පත් තීරණ ඇතුළත් වාර්තාව, මීළඟ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශ සහ න්‍යාය පත්‍රයේ එක් එක් පිටපත බැගින් අන්තර්ගත වන ගොනු සකස් කිරීම.

(v) ඉහත පරිදි සකසන ලද න්‍යාය පත්‍රය හා අදාළ සංදේශද පසුගිය රැස්වීමේ කෙටුම්පත් වාර්තාව ද අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා සහ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් වන ගරු අමාත්‍යවරුන් වෙත ගෙන ගොස් භාර දීම.

(vi) අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීම පිළිබඳ පත් කිරීම් ලිපි නිකුත් කිරීමට ලේකම්වරයාට සහාය වීම.

(vii) සම්මත කරනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණ අදාළ අමාත්‍යාංශවල ලේකම්වරුන් වෙත හා අනෙකුත් බලධාරීන් වෙත ගෙනගොස් භාරදීම.

## 3.2 වාර්තා සම්පාදන හා භාෂා පරිවර්තන අංශය:

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ අවසන් නිමැවුම ලෙස සැලකිය හැකි, අමාත්‍ය මණ්ඩල රැස්වීම්වලදී ගනු ලැබූ තීරණ අන්තර්ගත අමාත්‍ය මණ්ඩල රැස්වීමේ වාර්තාව කෙටි කාලසීමාවක් තුළ භාෂාත්‍රයෙන්ම සැකසීම සඳහා මෙම අංශය දායක වේ. එකී කාර්යය ඉටු කිරීමේදී මෙම අංශයේ නිලධාරින් අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ සහ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ අතිරේක ලේකම්වරයාගේ සෘජු හා සමීප අධීක්ෂණය යටතේ කටයුතු කරනු ලබයි.

## 3.3 පරිගණක සේවා අංශය:

මෙම අංශය විසින් පහත කර්තව්‍යයන් ඉටු කරනු ලබයි:

(i) අමාත්‍ය මණ්ඩල රැස්වීම් වාර්තා, අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා රැස්වීම් වාර්තා හා අමාත්‍ය මණ්ඩලය හා අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා වෙත ඉදිරිපත් කරනු ලබන වෙනත් වාර්තා හා ලියකියවිලි භාෂාත්‍රයෙන් පරිගණකගත කිරීම.

(ii) මහජනතාව විසින් දැනගත යුතු වැදගත් අමාත්‍ය මණ්ඩල තීරණ හා වෙනත් අදාළ තොරතුරු අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ නිල වෙබ් අඩවියේ පළ කිරීම.

(iii) පසුගිය අමාත්‍ය මණ්ඩල තීරණ පිළිබඳ සාරාංශ හා දත්ත ඇතුළත් ගොනු අභ්‍යන්තර භාවිතය සඳහා මෘදු පිටපත් ලෙස පවත්වා ගැනීම.

## 3.4 ආයතන හා සේවා සැපයුම් අංශය:

කාර්යාලයේ කටයුතු කාර්යක්ෂමව හා විධිමත්ව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සියලු සහාය සේවාවන් හා පහසුකම් සලසන ඒකකය වශයෙන් ආයතන හා සේවා සැපයුම් අංශය කටයුතු කරනු ලබයි.

මෙම අංශය වෙත පහත සඳහන් කර්තව්‍යයන් පැවරී ඇත:

(i) දෛනික තැපෑලට අදාළ රාජකාරි කටයුතු.
(ii) කාර්යාලයේ නඩත්තු හා මෙහෙයුම් කටයුතු.
(iii) අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන වෙත ලිපි බෙදා හැරීම.
(iv) කාර්ය මණ්ඩලයේ නිලධාරින්ගේ පෞද්ගලික ලිපිගොනු සම්බන්ධ කටයුතුද ඇතුළත් සියලු ආයතනික හා පාලන කටයුතු.
(v) කාර්යාලය සඳහා භාණ්ඩ හා සේවා සැපයීම සම්බන්ධයෙන් වන ප්‍රසම්පාදන කටයුතු.
(vi) ප්‍රවාහන පහසුකම් (පණිවුඩ යැවීම) සහ සුබසාධන සේවාවන් ලබා දීම.
(vii) පුහුණුවීම් සඳහා නිලධාරින් යොමු කිරීම.

### 3.5 ගිණුම් අංශය:

මෙම අංශය වෙත පහත කර්තව්‍යයන් පැවරී ඇත:

(i) කාර්යාලයේ සියලුම ගිණුම් කටයුතු මෙහෙයවීම හා ගිණුම් වාර්තා කිරීම.

(ii) කාර්යාලය සඳහා අවශ්‍ය අක්මුදල් ලබාගැනීම හා බැංකු ගිණුම් පවත්වාගෙන යාම.

(iii) මහා භාණ්ඩාගාරය විසින් ඉල්ලා සිටින වාර්තා ඉදිරිපත් කිරීම.

(iv) කාර්ය මණ්ඩලයට වැටුප් හා දීමනා ගෙවීම්, වෙනත් පහසුකම් සලසා දීම සහ ඊට අදාළ ආනුෂංගික කටයුතු.

(v) කාර්යාලයට අදාළ වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීමට ලේකම්වරයාට සහාය වීම.

(vi) පාරිභෝජ්‍ය හා මූලධන වත්කම් ප්‍රසම්පාදනයට අදාළ කරුණු.

(vii) විගණන විමසුම්වලට අදාළ මූලික තොරතුරු ලේකම්වරයා වෙත ඉදිරිපත් කිරීම.

## 4. 2017 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්යසාධනය:

### 4.1 අමාත්‍ය මණ්ඩල රැස්වීම් සම්බන්ධයෙන් වූ කර්තව්‍යයන්:

4.1.1 2017 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩලයේ විශේෂ රැස්වීම් 03 ක් ද ඇතුළුව අමාත්‍ය මණ්ඩල රැස්වීම් 48 ක් පවත්වන ලදී. අමාත්‍ය මණ්ඩලයේ තීරණ අපේක්ෂාවෙන් විවිධ අමාත්‍යාංශවලින් අමාත්‍ය මණ්ඩල සංදේශ 3,034 ක් 2017 වසර තුළ ඉදිරිපත් කරනු ලැබිණි. එක් එක් අමාත්‍යාංශය විසින් 2017 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව ඇමුණුම Iහි දැක්වේ. 2017 වසර තුළ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් ලෙස කටයුතු කරන ලද ඇමතිවරුන්ගේ නාමලේඛනය ඇමුණුම IIහි දැක්වේ.

4.1.2 මෙකී සංදේශ සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශ වෙතින් නිරීක්ෂණ ලබාගැනීමට කටයුතු කරන ලද අතර, අවශ්‍ය අවස්ථාවන්හිදී අමාත්‍ය මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් එම සංදේශ පිළිබඳ නෛතික හා ප්‍රතිපත්තිමය පසුබිම හා එම යෝජනාවලින් පැන නඟින සංකූලතා ආදිය ගැන ගැඹුරින් අධ්‍යයනය කරන ලදී.

4.1.3 අමාත්‍ය මණ්ඩලය විසින් සාකච්ඡාවට ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල සංදේශවලට අදාළව එළඹී තීරණ ඇතුළත් වාර්තා මෙම කාර්යාලය විසින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවන්ගෙන් සකස් කර ගරු අමාත්‍යවරුන් වෙතත්, අදාළ තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී තිබූ අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත හා අනෙකුත් අදාළ ආයතන වෙතත් යොමු කරන ලදී.

*වගුව 1 : 2017 වර්ෂය තුළ ඒ ඒ අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කරන ලද කාර්යය අනුව සකසන ලද වර්ගීකරණයක සාරාංශය:*

| කාණ්ඩය | සංදේශ ගණන |
|---|---|
| ප්‍රතිපත්තිමය කටයුතු | 1,775 |
| ව්‍යවස්ථා සම්පාදනයට අදාළ කටයුතු | 105 |
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි අමාත්‍ය මණ්ඩලය විසින් ඉටු කළ යුතු ආයතනික කටයුතු | 622 |
| ප්‍රසම්පාදන කටයුතු | 310 |
| වාර්ෂික වාර්තා | 222 |
| **එකතුව** | **3,034** |

## 4.2 2017 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල කාරක සභා/ අනුකාරක සභාවලට අදාළ කටයුතු:

අමාත්‍ය මණ්ඩලයේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය පහසු කරලීම පිණිස නිශ්චිත ක්ෂේත්‍ර හෝ කරුණු සම්බන්ධයෙන් සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස පහත සඳහන් අමාත්‍ය මණ්ඩල කාරක සභා/ අනුකාරක සභා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද අතර එය 2017 වර්ෂය තුළදී ක්‍රියාත්මක විය.

(අ) ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කාරක සභාව

(ආ) ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව

(ඇ) ව්‍යවස්ථා කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව

(ඈ) ජීවන වියදම් පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව

## (අ) ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල කාරක සභාව:

2015-09-22 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය කාරක සභාව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද අතර, එය වෙත පහත සඳහන් කාර්යභාරය පැවරී තිබිණි:

(i) අමාත්‍ය මණ්ඩල සංදේශවල සඳහන් ආර්ථික කටයුතු, මුදල් ප්‍රතිපත්ති සහ රාජ්‍ය මූල්‍ය කටයුතුවලට අදාළ කරුණු පරීක්ෂා කර බලා, අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ii) ජාතික ආයෝජන වැඩසටහන හා රාජ්‍ය ආයෝජන වැඩසටහන පිළියෙල කිරීමේදී මාර්ගෝපදේශ ලබා දීම සහ පෞද්ගලික අංශයේ ආයෝජන සඳහා පහසුකම් සැලසීම;

(iii) ආර්ථික හා මූල්‍ය බලපෑම් සහිත යෝජනා පිළිබඳව අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම; සහ

(iv) රටේ ආයෝජනය/ආර්ථික සංවර්ධනය කෙරෙහි සෘජුව බලපාන විවිධ ව්‍යවස්ථා ක්‍රියාත්මක කිරීම පිළිබඳව අධීක්ෂණය කිරීම.

ඒ අනුව, ආර්ථික කළමනාකරණයට අදාළ කරුණු සම්බන්ධයෙන් සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පහත සඳහන් අමාත්‍යවරුන් (එවකට දරන ලද ධුර අනුව) ඉහත සඳහන් එම අමාත්‍ය මණ්ඩල කාරක සභාවේ සාමාජිකයින් ලෙස පත් කරනු ලැබූහ:

* ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා,
අග්‍රාමාත්‍ය සහ
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය(සභාපති);

* ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා,
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය;

* ගරු රවුෆ් හකීම් මැතිතුමා,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය;

* ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා,
ආපදා කළමනාකරණ අමාත්‍ය;

* ගරු රවි කරුණානායක මැතිතුමා,
මුදල් අමාත්‍ය (2017-05-23 දින සිට විදේශ කටයුතු අමාත්‍ය);

* ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය;

* ගරු කබීර් හෂීම් මැතිතුමා,
  රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය;

* ගරු අර්ජුන රණතුංග මැතිතුමා,
  වරාය හා නාවික කටයුතු අමාත්‍ය;

* ගරු සාගල රත්නායක මැතිතුමා,
  නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය; සහ

* ගරු මලික් සමරවික්‍රම මැතිතුමා,
  සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය.

එහිදී අග්‍රාමාත්‍ය ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරියකු මෙම කාරක සභාවේ ලේකම්/ කැඳවුම්කරු වශයෙන් කටයුතු කළ යුතු බවටත්, කාරක සභාවේ කාර්යයන් සඳහා අවශ්‍ය යයි සැලකෙන අන් කවර හෝ නිලධාරින්ගේ/විශේෂඥයින්ගේ සේවය කමිටුව විසින් ලබා ගත හැකි බවටත්, තීරණය කෙරිණි. මෙම අමාත්‍ය මණ්ඩල කාරක සභාවේ රැස්වීම් 36ක වාර්තා 2017 වර්ෂය තුළ දී අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරිණි.

**(ආ) ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව:**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ආයතන කටයුතුවලට අදාළව පහත සඳහන් බලතල අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී ඇත:

- රජයේ නිලධරයන් පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය සහ ඔවුන් සේවයෙන් පහ කිරීම ඇතුළු, රජයේ නිලධරයන්ට අදාළ සියලු ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම [55 වැනි ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව].

- දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය සහ ඔවුන් සේවයෙන් පහ කිරීම [55 වැනි ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව].

මෙම බලතල ක්‍රියාත්මක කිරීමේදී යෝග්‍යතම තීරණයට එළඹීමට අමාත්‍ය මණ්ඩලයට පහසු වනු පිණිස අමාත්‍යාංශවලින් ඉදිරිපත් කෙරුණු සංදේශ ගැඹුරින් අධ්‍යයනය කර අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ කාර්ය භාරය වේ.

මෙයට අමතරව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය ව්‍යවසායයන් හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි වාර්ෂික පරිපාලන වාර්තා/ කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිණිස අනුමැතිය ලබා ගැනීමට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ පරීක්ෂා කර ඊට අදාළ නිර්දේශ ඉදිරිපත්

කිරීමේ වගකීමද ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව වෙත පවරනු ලැබිණි.

ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව පහත සඳහන් අමාත්‍යවරුන්ගෙන් සමන්විත විය.

- ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මැතිතුමා
  බුද්ධ ශාසන අමාත්‍ය සහ අධිකරණ අමාත්‍ය -(සභාපති) (2017 අගෝස්තු 15 දින දක්වා);
- ගරු සරත් අමුණුගම මැතිතුමා
  විශේෂ කාර්යභාර අමාත්‍ය - (සභාපති) (2017 අගෝස්තු 29 දින සිට)
- ගරු මංගල සමරවීර මැතිතුමා
  මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය - (2017 අගෝස්තු 29 දින සිට)
- ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා
  ආපදා කළමනාකරණ අමාත්‍ය;
- ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා
  විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය;
- ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මැතිතුමා;
  සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය
- ගරු රවි කරුණානායක මැතිතුමා
  මුදල් අමාත්‍ය(2017 අගෝස්තු 15 දින දක්වා);
- ගරු වජිර අබේවර්ධන මැතිතුමා
  ස්වදේශ කටයුතු අමාත්‍ය;
- ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා
  රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍ය;
- ගරු තලතා අතුකෝරල මැතිතුමිය
  විදේශ රැකියා අමාත්‍ය;
- ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමා
  අධ්‍යාපන අමාත්‍ය;

දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීම සඳහා වූ සංදේශ මෙම කාර්යාලය වෙත ලද වහාම නිර්දේශිත නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන ඇත්ද යන්න හෝ එසේ කිරීමට අදහස් කර ඇත්ද යන්න පිළිබඳව එම නිලධාරීන් අයත් වන සේවාවන්වල පත්වීම් බලධරයා වෙතින් සහ පරිපාලන බලධරයා වෙතින් වාර්තා කැඳවා දෙපාර්තමේන්තු ප්‍රධානියකු පත් කිරීමේදී නිර්ණායකයක් ලෙස සලකා බලන ලදී.

විවිධ අමාත්‍යාංශ වෙතින් 2017 වර්ෂය තුළදී ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ විෂයපථයට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ 622ක් ඉදිරිපත් වී තිබූ අතර, එම සංදේශ පිළිබඳව සාකච්ඡා කිරීමට ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා රැස්වීම් 21ක් පවත්වන ලදී. අනුකාරක සභාවේ නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත.

මෙම කාර්යභාරය සඳහා පහත නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවට සහාය වූ අතර, එම නිලධාරි කමිටුව සහභාගි වූ රැස්වීම් 21ක් අදාළ වසර තුළ දී අමාත්‍ය මණ්ඩල කාර්යාලයේදී පැවැත්විණි.

(i) අමාත්‍ය මණ්ඩලයේ ලේකම්;

(ii) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් / අතිරේක ලේකම්;

(iii) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්;

(iv) ආයතන අධ්‍යක්ෂ ජනරාල්;

(v) ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්;

(vi) කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්;

(vii) ආරාධනා මත අදාළ අමාත්‍යාංශ නිලධාරීන් (අවස්ථානුකූලව); සහ

(viii) අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ අතිරේක ලේකම්වරයා සහ අදාළ අනෙකුත් නිලධාරීන්.

එසේම අවශ්‍ය අවස්ථාවලදී ඇතැම් කරුණු පිළිබඳව ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ ලබාගැනීමට ද කටයුතු කරන ලදී. අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලා, ඉහත කී අමාත්‍ය මණ්ඩල සංදේශ 622 සම්බන්ධයෙන්ම සිය තීරණ ලබා දී ඇති අතර, එකී තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත හා අනෙකුත් අදාළ ආයතන වෙත අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් අදාළ තීරණ යවනු ලැබ ඇත.

2017 වසර තුළ අමාත්‍ය මණ්ඩලය විසින් දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ රාජ්‍ය අමාත්‍යාංශවල ලේකම්වරුන් 53 ක් පත් කිරීම සම්බන්ධයෙන් තීරණ ගන්නා ලද අතර ඒ සඳහා වූ පත්වීම් ලිපි අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා විසින් නිකුත් කරන ලදී.

### (ඇ) ව්‍යවස්ථා කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව:

අලුතින් නීති සම්පාදනය කිරීම සඳහා හෝ පවතින නීතියක් සංශෝධනය කිරීම සඳහා හෝ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වන පනත් කෙටුම්පත් ඇතුළත් සංදේශ ගැඹුරින් අධ්‍යයනය කර, සිය නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම පිණිස වූ ව්‍යවස්ථා කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව පහත සඳහන් අමාත්‍යවරුන්ගෙන් සමන්විත විය:

- ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මැතිතුමා
  බුද්ධ ශාසන අමාත්‍ය සහ අධිකරණ අමාත්‍ය -(සභාපති)
  (2017 අගෝස්තු 15 දින දක්වා);
- ගරු මංගල සමරවීර මැතිතුමා
  විදේශ කටයුතු අමාත්‍ය (2017 මැයි 23 දින සිට මුදල් අමාත්‍ය);
- ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා
  ආපදා කළමනාකරණ අමාත්‍ය;
- ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා
  විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය;
- ගරු නවින් දිසානායක මැතිතුමා
  වැවිලි කර්මාන්ත අමාත්‍ය.

එම අනුකාරක සභාවට සහාය වීම පිණිස අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ අදාළ අමාත්‍යාංශයන්හි නියෝජිතයන්ගෙන් සැදුම්ලත් නිලධාරි කමිටුවක් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කර තිබුණි.

### (ඇ) ජීවන වියදම් පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව

2015-09-22 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, ජීවන වියදමට අදාළ කරුණු පිළිබඳව අවශ්‍ය නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම පිණිස පහත සඳහන් අමාත්‍යවරුන්ගෙන් සැදුම්ලත් ඉහත අනුකාරක සභාව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලදී:

* මලික් සමරවික්‍රම මැතිතුමා,
  සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය - (සභාපති);
* ගරු ඩබ්ලිව්.ඩී.ජේ.සෙනෙවිරත්න මැතිතුමා,
  කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය;
* ගරු රවි කරුණානායක මැතිතුමා,
  මුදල් අමාත්‍ය (2017 අගෝස්තු 15 දින දක්වා);

* ගරු පී.හැරිසන් මැතිතුමා,
  ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍ය;

* ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමා,
  අධ්‍යාපන අමාත්‍ය;

එසේම කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා මෙම අනුකාරක සභාවේ ලේකම්/ කැඳවුම්කරු වශයෙන් ක්‍රියා කළ යුතු බවට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී. මෙම අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ රැස්වීම් 29ක වාර්තා 2017 වර්ෂය තුළ දී අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරිණි.

### 4.3 විවිධ විෂයයන් සම්බන්ධයෙන් අධ්‍යයනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන නිලධාරි කමිටුවලට අදාළ කටයුතු:

අමාත්‍ය මණ්ඩල රැස්වීම්වලදී මතු වූ විවිධ කරුණු පිළිබඳව වැඩිදුර අධ්‍යයනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් 2017 වසරේදී අමාත්‍ය කමිටු 04 ක් හා නිලධාරි කමිටු 16 ක් පත් කරන ලද අතර එම කමිටු විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ ඇතුළත් වාර්තා 8 ක් 2017 වසර තුළ අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කොට ඒ අනුව ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම පිණිස අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් හා ආයතන වෙත දන්වා යවන ලදී.

### 4.4 උපරිමාධිකරණයන්හි විභාගයට ගැනෙමින් පවතින නඩු කටයුතු සම්බන්ධයෙන් අවශ්‍ය වන තොරතුරු සහ අමාත්‍ය මණ්ඩල තීරණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම:

අමාත්‍ය මණ්ඩලය හෝ අමාත්‍ය මණ්ඩල ලේකම්වරයා වගඋත්තරකරුවන් ලෙස නම් කෙරුණු ශ්‍රේෂ්ඨාධිකරණ (මූලික අයිතිවාසිකම්) අයදුම්පත් සහ අභියාචනාධිකරණ (රිට් ආඥා) අයදුම්පත් කිහිපයක දිවුරුම් පෙත්සම්/ පෙත්සම්වල අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින ලදී. ඒ අනුව අදාළ අමාත්‍ය මණ්ඩල තීරණයන්හි පිටපත්ද සමඟින් ඒ සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත කඩිනමින් ලබා දීමට කටයුතු කරන ලදී. මේ සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශ විමසමින් එම අමාත්‍යාංශ සමඟ ඍජු සන්නිවේදනයන් පවත්වා ගැනීමට මෙම කාර්යාලය කටයුතු කළ අතර, නීතිපතිතුමා විසින් ඉල්ලා සිටින ලද තොරතුරු සවිස්තරාත්මකව ලබා දෙන ලදී. 2017 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් නඩු කටයුතු 36 ක් සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කරන ලදී.

## 4.5 2017 වසර තුළ සිදු කරන ලද විශේෂයෙන් සඳහන් කළ යුතු කාර්යභාරයන්:

4.5.1 2017 ජූලි 07 වන දින ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් සංවිධානය කරන ලද, අමාත්‍යාංශ ලේකම්වරුන් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ සහභාගිත්වයෙන් පැවති වැඩමුළුවකදී "අමාත්‍ය මණ්ඩල සංදේශ සහ සටහන් සකස් කිරීම" සම්බන්ධයෙන් විශේෂ ඉදිරිපත් කිරීමක් අමාත්‍ය මණ්ඩල ලේකම් විසින් සිදු කරන ලදී.

4.5.2 මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ ඉල්ලීම් මත විමර්ශන කටයුතු සඳහා අවශ්‍ය පැරණි අමාත්‍ය මණ්ඩල තීරණ, සංදේශ හා වාර්තා කඩිනමින් නිකුත් කිරීමට කටයුතු කිරීම.

4.5.3 අමාත්‍ය මණ්ඩල ලේකම්වරයා සාමාජිකයෙකු ලෙස විවිධ කමිටුවල ක්‍රියා කරන ලද අතර ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය අනු කමිටුවට සහය වන නිලධාරි කමිටුවේ සභාපති ලෙසද ඔහු කටයුතු කරන ලදී.

4.5.4 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ විධිවිධාන අමාත්‍ය මණ්ඩල කාර්යාලයට අදාළව ක්‍රියාත්මක කිරීම එම පනත බලාත්මක වීම ආරම්භ වූ 2017-02-03 දින සිටම සිදු කිරීමට පියවර ගන්නා ලදී. අමාත්‍ය මණ්ඩල ලේකම්වරයා විසින් නම් කරන ලද 'තොරතුරු නිලධාරි' ලෙස කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකු පත් කරන ලද අතර, මහජනතාවට තොරතුරුවලට ප්‍රවේශ විය හැකි ආකාරය ඇතුළත් තොරතුරු හා අදාළ අයදුම්පත් කාර්යාලයේ නිල වෙබ් අඩවියේ පළ කරන ලදී. ඒ අනුව අදාළ පනත මඟින් තොරතුරු ලබා දීමට පනවා ඇති ඇතැම් සීමාවන්ට යටත්ව, මහජනතාව වෙත අමාත්‍ය මණ්ඩල තීරණ හා සම්බන්ධ තොරතුරු ලබා දීම සිදු කරන ලදී. උක්ත පනත අමාත්‍ය මණ්ඩල කාර්යාලයට අදාළව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් 2017-03-21 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කරනු ලැබ තිබේ. තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරු ඉල්ලීම් 215ක් 2017 වර්ෂය තුළ ඉදිරිපත් වී ඇති අතර, ඒ සෑම ඉල්ලීමක් සඳහාම නියමිත කාලවකවානු ඇතුළත ප්‍රතිචාර දක්වනු ලැබ තිබේ.

## 5. අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්යභාරයේ විශේෂත්වය:

අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත පැවරී ඇති කාර්යභාරයේ සුවිශේෂත්වය නිසා බොහෝ අවස්ථාවලදී අනෙකුත් රජයේ ආයතනවල කටයුතු කෙරෙන සාමාන්‍ය ආකාරයෙන් බැහැරව කටයුතු කිරීමට අමාත්‍ය මණ්ඩල කාර්යාලයට සිදු වේ. විශේෂයෙන්ම අමාත්‍ය මණ්ඩල රැස්වීම් දෙකක් අතර කාල පරතරය සතියකට පමණක් සීමා වන බැවින්, පහත ආකාරයේ කල් දැමිය නොහැකි කාර්යභාරයන් රැසක් ඉතාම කෙටි කාලයක් තුළ ඉටු කිරීම අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්ය මණ්ඩලය වෙත පැවරී ඇත.

* අඟහරුවාදා පැවැත්වෙන සතියේ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ වාර්තාව එම සතියේ බ්‍රහස්පතින්දා පෙරවරුව වන විට භාෂාත්‍රයෙන් පිළියෙල කිරීම.

* ඊළඟ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට අදහස් කෙරෙන අමාත්‍ය මණ්ඩල සංදේශවල අන්තර්ගත කරුණු පිළිබඳව අධ්‍යයනය කිරීම.

* එම සංදේශවලට අදාළ අවශ්‍ය අතිරේක තොරතුරු රැස් කිරීම හා එම කරුණු සම්බන්ධයෙන් මීට පෙර අමත්‍ය මණ්ඩල තීරණ කිසිවක් තිබේ නම් ඒ පිළිබඳ තොරතුරු සොයා බැලීම.

* ඇතැම් සංදේශවල සඳහන් යෝජනාවන් ක්‍රියාත්මක කිරීමේදී පැන නැඟිය හැකි ප්‍රතිපත්තිමය හා නෛතික සංකූලතා ගැන අධ්‍යයනය කිරීම. (අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින්)

* එම සංදේශවල අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් අදාළ වන පරිදි, ඒ ඒ අමාත්‍යාංශ භාර ගරු අමාත්‍යතුමන් වෙතින් නිරීක්ෂණ ලබාගැනීම.

මෙම සියලු කටයුතු කිරීමේදී එම කරුණු සම්බන්ධයෙන් රහස්‍යභාවය ආරක්ෂා කිරීම නිලධාරීන්ගේ වගකීමක් වන අතර, එය ඉහළ මට්ටමින් පවත්වා ගනිමින්, සතියේ දිනවල සාමාන්‍ය රාජකාරි වේලාවන් ඉක්මවා රාත්‍රී කාලයේ රාජකාරියේ නිරත වීමටත්, සති අන්ත දිනවල හා රජයේ නිවාඩු දිනවල සේවයේ යෙදීමටත් අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ නිලධාරීන්ට සිදු විය.

මෙම හේතුව නිසා අමාත්‍ය මණ්ඩල කාර්යාලයට නිලධාරීන් බඳවා ගනු ලැබීමේදී ඉහත සඳහන් අවශ්‍යතාවයන්ට ගැළපෙන, විශේෂයෙන් තෝරාගත්, කුසලතා සහිත නිලධාරීන් පිරිසක් බඳවාගැනීමට කටයුතු කරනු ලැබ ඇති අතර, 2017 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ සේවයේ යෙදුණු නිලධාරීන් පිළිබඳ තොරතුරු 6 වන ඡේදයෙහි ඇතුළත් වේ.

විශේෂයෙන්ම පළපුරුදු භාෂා පරිවර්තකයින්ගේ හිඟය හේතු කොට ගෙන භාෂා පරිවර්තන කටයුතු සඳහා විශ්‍රාමික නිලධාරීන් දෙදෙනෙකුගේ සේවය 2017 වසර තුළදීද තවදුරටත් ලබාගැනීමට අමාත්‍ය මණ්ඩල කාර්යාලයට සිදු විය.

## 6. මානව සම්පත් කළමනාකරණය:

### 6.1 2017-12-31 දිනට සේවක සංඛ්‍යා තොරතුරු

*වගුව 2 – 2017-12-31 දිනට සේවා නියුක්තික වර්ගීකරණය*

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | | | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | | ස්ථිර පදනම මත | කොන්ත්‍රාත් පදනම මත | එකතුව | | |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 24 | 12 | 02 | 14 | 10 | - |
| තෘතියික මට්ටම | 11 | 07 | 01 | 08 | 03 | - |
| ද්විතියික මට්ටම | 32 | 24 | - | 24 | 08 | - |
| ප්‍රාථමික මට්ටම | 32 | 25 | - | 25 | 07 | - |
| එකතුව | **99** | **68** | **03** | **71** | **28** | - |

### 6.2 2017-12-31 දිනට සිටි කාර්ය මණ්ඩලය

*වගුව 3 - 2017-12-31 දිනට කාර්ය මණ්ඩල විස්තරය*

| | තනතුර | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 01. | ලේකම් | 01 | 01 | - |
| 02. | අතිරේක ලේකම් | 03 | 01 | 02 |
| 03. | නීති උපදේශක * | 01 | 01 | - |
| 04. | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 06 | 03 | 03 |
| 05. | අභ්‍යන්තර විගණක | 01 | - | 01 |
| 06. | සහකාර ලේකම් (ශ්‍රී ලං.ප.සේ.) | 08 | 04 | 04 |
| 07. | ගණකාධිකාරී | 01 | 01 | - |
| 08. | සහකාර ලේකම් (ශ්‍රී ලං.ප.සේ. නොවන) | 01 | 01 | - |
| 09. | සහකාර අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ | 01 | 01 | - |
| 10. | භාෂා උපදේශක * | 01 | 01 | - |
| 11. | පරිපාලන නිලධාරී | 01 | - | 01 |
| 12. | භාෂා අධීක්ෂක | 01 | - | 01 |
| 13. | සම්බන්ධීකරණ ලේකම් | 01 | 01 | - |
| 14. | භාෂා සම්බන්ධීකාරක * | 01 | 01 | - |
| 15. | භාෂා පරිවර්තක | 05 | 04 | 01 |
| 16. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 01 | 01 | - |
| 17. | ප්‍රගති සහකාර | 01 | 01 | - |
| 18. | සංවර්ධන නිලධාරී | 02 | - | 02 |
| 19. | පුස්තකාලයාධිපති | 01 | - | 01 |
| 20. | රාජ්‍ය කළමනාකරණ සහකාර | 27 | 23 | 04 |
| 21. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 02 | 01 | 01 |
| 22. | රියැදුරු | 13 | 12 | 01 |
| 23. | කා.සේ.සේ. | 18 | 13 | 05 |
| 24. | පිළිගැනීමේ නිලධාරී | 01 | - | 01 |
| | එකතුව | **99** | **71** | **28** |

**සටහන:** * කොන්ත්‍රාත් පදනම මත.

## 6.3 2017 වසර තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ සේවයට අලුතින් එක් වූ සේවක මහත්ම/මහත්මීන්.

2017 වසර තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්ය මණ්ඩලය ශක්තිමත් කරමින් නිලධාරිහු දෙදෙනෙක් (02) අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ සේවයට අලුතෙන් එක් වූහ.

## 6.4 විශ්‍රාම ගැනීම්

2017 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ සේවය කරමින් සිටි නිලධාරින් තිදෙනෙක් (03) (කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවනු ලැබ සිටි නිලධාරිනියකද ඇතුළුව) රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

## 6.5 ස්ථාන මාරුවීම්

2017 වසර තුළ නිලධාරින් දෙදෙනෙක් (02) ස්ථාන මාරුවීම් ලබා අමාත්‍ය මණ්ඩල කාර්යාලයෙන් වෙනත් සේවා ස්ථාන කරා නික්ම ගියහ.

## 6.6 පුහුණුව හා සංවර්ධනය

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්යබහුල රාජකාරි ස්වාභාවය මධ්‍යයේ පවා 2017 වසර තුළ සිය සේවක මහත්ම මහත්මීන්ගේ ඉල්ලීම් හා ආරාධනාවන් අනුව විදේශ පුහුණුවීම් අවස්ථා දෙකක් (02) ඇතුළුව සේවක මහත්ම/මහත්මීන් වෙත පුහුණුවීම් අවස්ථා කිහිපයක් ලබා දීමට මෙම කාර්යාලයට හැකි විය. තවද සිය සේවා ක්ෂේත්‍රයන්ට අදාළ වන උසස් අධ්‍යයන පාඨමාලා හැදෑරීම සඳහා නිලධාරින් දෙදෙනෙකු (02) වෙත අරමුදල් සපයා දෙන ලදී.

# 7. මූල්‍ය හා ගිණුම් කටයුතු සමාලෝචනය

## 7.1 ඇස්තමේන්තු:

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ 2017 වර්ෂය සඳහා පුනරාවර්තන හා මූලධන වියදම් යටතේ මුළු ප්‍රතිපාදනයත් මුළු වියදමත් පහත පරිදි විය.

*වගුව 4 - 2017 වියදම් සාරාංශය*

| වියදමේ ස්වභාවය | මුළු ප්‍රතිපාදනය රු. | තථ්‍ය වියදම රු. | ප්‍රගතිය % | ඉතිරිය රු. |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම | 78,085,000/- | 72,914,213/- | 93 | 5,170,787/- |
| මූලධන වියදම | *12,200,000/- | 2,108,927/- | 17 | 10,091,073/- |
| **මුළු එකතුව** | **90,285,000/-** | **75,023,140/-** | **83** | **15,261,860/-** |

අමාත්‍ය මණ්ඩලය සතිපතා රැස්වන බැවින් මොන යම් හෝ තාක්ෂණික ප්‍රමාදයක් සිදුවුවහොත් සමස්ත ක්‍රියාවලියම අඩපණ විමට ඉඩ ඇති බැවින් අවශ්‍යයැයි තක්සේරු කරන ලද අවශ්‍ය අවම ප්‍රතිපාදන ප්‍රමාණය අයවැය ඇස්තමේන්තු මඟින් වෙන් කරගැනීමට කටයුතු කරන ලදී. එහෙත් රජයේ මුදල් අනවශ්‍ය අයුරින් වියදම් කිරීමෙන් තොරව අත්‍යවශ්‍ය කාර්යයන් සඳහා පමණක් වියදම් දැරීම හේතුවෙන් යම් ප්‍රතිපාදන ඉතිරියක් 2017 වර්ෂය තුළදී පෙන්නුම් කරනු ලබයි.

මූලධන වත්කම් අත්පත් කරගැනීම් වැය විෂයන්හි ප්‍රතිපාදන උපයෝගී කරගනිමින්, 2017 වර්ෂය තුළ එක් (01) වායු සමීකරණ යන්ත්‍රයක්, වානේ අල්මාරි 06 ක්, ලිපි ගොනු රාක්කයක් (01), වීදුරු දොර සහිත වානේ අල්මාරියක් (01), පොත් බැඳීමේ යන්ත්‍රක් (01), පරිගණක යන්ත්‍ර06ක්, යූ.පී.එස්. උපකරණ 06ක්, පරිගණක මුද්‍රණ යන්ත්‍ර 04ක් සහ ස්ථාවර දුරකථන 04ක් මිල දී ගනු ලැබිණි.

* ලේඛන කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද රුපියල් මිලියන 03 ප්‍රතිපාදන අතුළත් ය. (මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වගකීම ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිතායතනයට පවරනු ලැබ ඇත.)

## 7.2 නිලධාරින් සඳහා ණය අත්තිකාරම් ලබාදීම

2017 වර්ෂය තුළ මෙම කාර්යාලයේ නිලධාරින් සඳහා අත්තිකාරම් "බී" ගිණුම යටතේ පහත සඳහන් පරිදි රු. 3,353,121.00ක ණය පහසුකම් ලබා දී ඇත.

*වගුව 5 - අත්තිකාරම් "බී" ගිණුම යටතේ ලබා දෙන ලද ණය පහසුකම්*

| ලබාදුන් ණය වර්ගය | නිලධාරින් සංඛ්‍යාව | ණය මුදල් ප්‍රමාණය (රුපියල්) |
|---|---|---|
| ආපදා ණය | 21 | 2,711,121.00 |
| උත්සව අත්තිකාරම් | 51 | 510,000.00 |
| විශේෂ අත්තිකාරම් | 33 | 132,000.00 |
| **එකතුව** | **105** | **3,353,121.00** |

## 7.3 **වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම:**

2017 වර්ෂය සඳහා අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් ඉදිරිපත් කළ යුතු වාර්ෂික විසර්ජන ගිණුම **(ඇමුණුම III),** අත්තිකාරම් "බී" ගිණුම **(ඇමුණුම IV)** විගණකාධිපතිවරයා වෙත යවා ඇත.

## 7.4 **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම:**

2017 වර්ෂයට අදාළ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය අවසන් කරනු ලැබ ඇති අතර, එම වාර්තාව 2018-05-04 දින විගණකාධිපතිවරයා යොමු කර ඇත.

## 7.5 **විගණන විමසුම්**:

2017 වර්ෂය සඳහා විගණන විමසුම් එකක් මේ වන විට ලැබී ඇති අතර, ඒ සඳහා වන පැහැදිලි කිරීම් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. එම විගණන විමසුම් මඟින් පෙන්වා දී තිබූ ඇතැම් කරුණු සම්බන්ධයෙන් නැවත පැහැදිලි කිරීම් සවිස්තරව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර ඇත. එකී විමසුම් බොහෝමයකට පාදක වී ඇත්තේ මතභේදයට තුඩු දෙන ගෙවීම් හෝ මූල්‍ය අක්‍රමිකතා කිසිවක් නොව ඇතැම් චක්‍රලේඛවලට අනුකූල වන පරිදි ලේඛන පවත්වාගෙන නොයාම හා සම්මත ආකෘති පත්‍ර භාවිත නොකිරීම වැනි කරුණු පිළිබඳවය.

## 2017-01-01 දින සිට 2017-12-31 දින දක්වා අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා සහ අමාත්‍යවරුන් විසින් අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව

| | අමාත්‍යාංශය | සංදේශ සංඛ්‍යාව |
|---|---|---|
| 01. | අතිගරු ජනාධිපතිතුමා | 72 |
| 02. | අග්‍රාමාත්‍යතුමා | 122 |
| 03. | ආරක්ෂක අමාත්‍යාංශය | 113 |
| 04. | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | 62 |
| 05. | ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය | 6 |
| 06. | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | 165 |
| 07. | සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය | 12 |
| 08. | තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය | 40 |
| 09. | ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය | 130 |
| 10. | විදේශ කටයුතු අමාත්‍යාංශය | 68 |
| 11. | සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය | 42 |
| 12. | කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍යාංශය | 39 |
| 13. | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය | 83 |
| 14. | නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය | 64 |
| 15. | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 47 |
| 16. | විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 71 |
| 17. | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 165 |
| 18. | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | 193 |
| 19. | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | 40 |
| 20. | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 24 |
| 21. | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 36 |
| 22. | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 62 |
| 23. | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | 150 |
| 24. | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 52 |
| 25. | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 71 |
| 26. | විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය | 71 |
| 27. | කෘෂිකර්ම අමාත්‍යාංශය | 53 |
| 28. | වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 36 |
| 29. | බුද්ධශාසන අමාත්‍යාංශය | 23 |
| 30. | අධිකරණ අමාත්‍යාංශය | 80 |
| 31. | ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය | 27 |
| 32. | රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය | 68 |
| 33. | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 44 |

| | අමාත්‍යාංශය | සංදේශ සංඛ්‍යාව |
|---|---|---|
| 34. | පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය (2017-01-01 සිට 2017-05-22 දක්වා) | 12 |
| 35. | නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය | 62 |
| 36. | වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය | 50 |
| 37. | ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 50 |
| 38. | කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | 15 |
| 39. | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | 13 |
| 40. | විදේශ රැකියා අමාත්‍යාංශය | 14 |
| 41. | අධ්‍යාපන අමාත්‍යාංශය | 55 |
| 42. | තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය | 29 |
| 43. | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 49 |
| 44. | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | 21 |
| 45. | ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 39 |
| 46. | ක්‍රීඩා අමාත්‍යාංශය | 39 |
| 47. | නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය | 52 |
| 48. | විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය | 33 |
| 49. | ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය | 10 |
| 50. | ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය | 11 |
| 51. | සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | 75 |
| 52. | විශේෂ කාර්යභාර අමාත්‍යාංශය | 17 |
| 53. | ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය | 9 |
| 54. | අමාත්‍ය මණ්ඩල ලේකම් | 42 |
| 55. | සංවර්ධන කාර්යභාර අමාත්‍යාංශය | 6 |
| **එකතුව** | | **3,034** |

<u>**ඇමුණුම II(අ)**</u>

**අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින්**
**(2017-01-01 සිට 2017-05-22 දක්වා)**

| | අමාත්‍යවරයා | අමාත්‍ය ධූරය |
|---|---|---|
| 1. | අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා | ජනාධිපති<br>ආරක්ෂක අමාත්‍ය;<br>මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍ය; සහ<br>ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍ය |
| 2. | ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා | අග්‍රාමාත්‍ය සහ<br>ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය |
| 3. | ගරු ජෝන් අමරතුංග මැතිතුමා | සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය<br>ඉඩම් අමාත්‍ය |
| 4. | ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා | තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍ය |
| 5. | ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය |
| 6. | ගරු මංගල සමරවීර මැතිතුමා | විදේශ කටයුතු අමාත්‍ය |
| 7. | ගරු එස්.බී.දිසානායක මැතිතුමා | සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍ය |
| 8. | ගරු ඩබ්ලිව්.ඩී.ජේ.සෙනෙවිරත්න මැතිතුමා | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය |
| 9. | ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය |
| 10. | ගරු (ආචාර්ය) සරත් අමුණුගම මැතිතුමා | විශේෂ කාර්යභාර අමාත්‍ය |
| 11. | ගරු රවුෆ් හකීම් මැතිතුමා | නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය |
| 12. | ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා | ආපදා කළමනාකරණ අමාත්‍ය |
| 13. | ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා | විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය |
| 14. | ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මැතිතුමා | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය |
| 15. | ගරු රවි කරුණානායක මැතිතුමා | මුදල් අමාත්‍ය |
| 16. | ගරු මහින්ද සමරසිංහ මැතිතුමා | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍ය |
| 17. | ගරු වජිර අබේවර්ධන මැතිතුමා | ස්වදේශ කටයුතු අමාත්‍ය |
| 18. | ගරු එස්.බී.නාවින්න මැතිතුමා | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය |
| 19. | ගරු රිෂාඩ් බදියුදීන් මැතිතුමා | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය |
| 20. | ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය |
| 21. | ගරු මහින්ද අමරවීර මැතිතුමා | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය |
| 22. | ගරු නවීන් දිසානායක මැතිතුමා | වැවිලි කර්මාන්ත අමාත්‍ය |
| 23. | ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා | විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය |
| 24. | ගරු දුමින්ද දිසානායක මැතිතුමා | කෘෂිකර්ම අමාත්‍ය |
| 25. | ගරු විජිත් විජයමුණි සොයිසා මැතිතුමා | වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍ය |
| 26. | ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මැතිතුමා | බුද්ධශාසන අමාත්‍ය; සහ<br>අධිකරණ අමාත්‍ය |
| 27. | ගරු පී.හැරිසන් මැතිතුමා | ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍ය |
| 28. | ගරු කබීර් හෂීම් මැතිතුමා | රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය |
| 29. | ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍ය |

| | | |
|---|---|---|
| 30. | ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා | පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය |
| 31. | ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා | නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය |
| 32. | ගරු අර්ජුන රණතුංග මැතිතුමා | වරාය හා නාවික කටයුතු අමාත්‍ය |
| 33. | ගරු යූ. පලනි දිගම්බරම් මැතිතුමා | කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍ය |
| 34. | ගරු චන්ද්‍රානි බණ්ඩාර මැතිතුමිය | කාන්තා හා ළමා කටයුතු අමාත්‍ය |
| 35. | ගරු තලතා අතුකෝරල මැතිතුමිය | විදේශ රැකියා අමාත්‍ය |
| 36. | ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමා | අධ්‍යාපන අමාත්‍ය |
| 37. | ගරු එම්.එච්.ඒ.හලීම් මැතිතුමා | තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍ය |
| 38. | ගරු ෆයිසර් මුස්තාපා මැතිතුමා | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය |
| 39. | ගරු ඩී.එම්.ස්වාමිනාදන් මැතිතුමා | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍ය |
| 40. | ගරු චන්දිම වීරක්කොඩි මැතිතුමා | ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍ය |
| 41. | ගරු දයාසිරි ජයසේකර මැතිතුමා | ක්‍රීඩා අමාත්‍ය |
| 42. | ගරු සාගල රත්නායක මැතිතුමා | නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය |
| 43. | ගරු හරීන් ප්‍රනාන්දු මැතිතුමා | විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍ය |
| 44. | ගරු මනෝ ගනේෂන් මැතිතුමා | ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා පිළිබඳ අමාත්‍ය |
| 45. | ගරු දයා ගමගේ මැතිතුමා | ප්‍රාථමික කර්මාන්ත අමාත්‍ය |
| 46. | ගරු මලික් සමරවික්‍රම මැතිතුමා | සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය |
| 47. | ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මැතිතුමා | ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍ය |

ඇමුණුම II(ආ)

## අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින්
## (2017-05-23 සිට 2017-12-31 දක්වා)

| | අමාත්‍යවරයා | අමාත්‍ය ධූරය |
|---|---|---|
| 01. | අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා | ජනාධිපති<br>ආරක්ෂක අමාත්‍ය;<br>මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍ය; සහ<br>ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍ය |
| 02. | ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා | අග්‍රාමාත්‍ය සහ<br>ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය |
| 03. | ගරු ජෝන් අමරතුංග මැතිතුමා | සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය |
| 04. | ගරු ගාමිණි ජයවික්‍රම පෙරේරා මැතිතුමා | බුද්ධශාසන අමාත්‍ය සහ<br>තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍ය |
| 05. | ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය |
| 06. | ගරු මංගල සමරවීර මැතිතුමා | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය |
| 07. | ගරු එස්.බී.දිසානායක මැතිතුමා | සමාජ සවිබලගැන්වීම්,සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍ය |
| 08. | ගරු ඩබ්ලිව්.ඩී.ජේ.සෙනෙවිරත්න මැතිතුමා | කම්කරු,වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍ය |
| 09. | ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය |
| 10. | ගරු (ආචාර්ය) සරත් අමුණුගම මැතිතුමා | විශේෂ කාර්යභාර අමාත්‍ය |
| 11. | ගරු රවුෆ් හකීම් මැතිතුමා | නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය |
| 12. | ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා | ආපදා කළමනාකරණ අමාත්‍ය |
| 13. | ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා | විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය |
| 14. | ගරු. තිලක් මාරපන මැතිතුමා | සංවර්ධන කාර්යභාර අමාත්‍ය |
| 15. | ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මැතිතුමා | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය |
| 16. | ගරු රවි කරුණානායක මැතිතුමා | විදේශ කටයුතු අමාත්‍ය |
| 17. | ගරු මහින්ද සමරසිංහ මැතිතුමා | වරාය හා නාවික කටයුතු අමාත්‍ය |
| 18. | ගරු වජිර අබේවර්ධන මැතිතුමා | ස්වදේශ කටයුතු අමාත්‍ය |
| 19. | ගරු එස්.බී.නාවින්න මැතිතුමා | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය |
| 20. | ගරු රිෂාඩ් බදියුදීන් මැතිතුමා | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය |
| 21. | ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය |
| 22. | ගරු මහින්ද අමරවීර මැතිතුමා | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය |
| 23. | ගරු නවින් දිසානායක මැතිතුමා | වැවිලි කර්මාන්ත අමාත්‍ය |
| 24. | ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා | විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය |
| 25. | ගරු දුමින්ද දිසානායක මැතිතුමා | කෘෂිකර්ම අමාත්‍ය |
| 26. | ගරු විජිත් විජයමුණි සොයිසා මැතිතුමා | වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍ය |
| 27. | ගරු පී.හැරිසන් මැතිතුමා | ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍ය |
| 28. | ගරු කබීර් හෂීම් මැතිතුමා | රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය |
| 29. | ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍ය |
| 30. | ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමා | ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය |
| 31. | ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා | නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය |

| | | |
|---|---|---|
| 32. | ගරු අර්ජුන රණතුංග මැතිතුමා | ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍ය |
| 33. | ගරු යූ. පලනි දිගම්බරම් මැතිතුමා | කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍ය |
| 34. | ගරු චන්ද්‍රානි බණ්ඩාර මැතිතුමිය | කාන්තා හා ළමා කටයුතු අමාත්‍ය |
| 35. | ගරු තලතා අතුකෝරල මැතිතුමිය | අධිකරණ අමාත්‍ය සහ<br>විදේශ රැකියා අමාත්‍ය |
| 36. | ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමා | අධ්‍යාපන අමාත්‍ය |
| 37. | ගරු එම්.එච්.ඒ.හලීම් මැතිතුමා | තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍ය |
| 38. | ගරු ෆයිසර් මුස්තාපා මැතිතුමා | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය |
| 39. | ගරු ඩී.එම්.ස්වාමිනාදන් මැතිතුමා | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍ය |
| 40. | ගරු චන්දිම වීරක්කොඩි මැතිතුමා | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍ය |
| 41. | ගරු දයාසිරි ජයසේකර මැතිතුමා | ක්‍රීඩා අමාත්‍ය |
| 42. | ගරු සාගල රත්නායක මැතිතුමා | නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය |
| 43. | ගරු හරීන් ප්‍රනාන්දු මැතිතුමා | විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍ය |
| 44. | ගරු මනෝ ගනේෂන් මැතිතුමා | ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා පිළිබඳ අමාත්‍ය |
| 45. | ගරු දයා ගමගේ මැතිතුමා | ප්‍රාථමික කර්මාන්ත අමාත්‍ය |
| 46. | ගරු මලික් සමරවික්‍රම මැතිතුමා | සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය |
| 47. | ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මැතිතුමා | ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍ය |

ඇමුණුම III

ඩී.ජී.එස්.ඒ - 1

# විසර්ජන ගිණුම 2017

**වියදම් ශීර්ෂ අංකය: 05** **අමාත්‍යාංශයේ නම : අමාත්‍ය මණ්ඩල කාර්යාලය**

| වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනේ අංකය | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි නම | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ. 66 සහ 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන්කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම (4-5) | පිටු අංකය (අදාළ ඩී.ජී.එස්.ඒ 2 ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| 1 | **පුනරාවර්තන**<br>මෙහෙයුම් වැඩ සටහන | 78,085,000 | | 3,800,000<br>(3,800,000) | 78,085,000 | 72,914,213 | 5,170,787 | 02 |
| | **උප එකතුව (පුනරාවර්තන)** | 78,085,000 | | | 78,085,000 | 72,914,213 | 5,170,787 | |
| 1 | **මූලධන**<br>මෙහෙයුම් වැඩ සටහන | 12,200,000 | | | 12,200,000 | 2,108,927 | 10,091,073 | 02 |
| | **උප එකතුව (මූලධන)** | 12,200,000 | | | 12,200,000 | 2,108,927 | 10,091,073 | |
| | **මුළු එකතුව** | **90,285,000** | | | **90,285,000** | **75,023,140** | **15,261,860** | |

පිටු අංක 2 සිට 18 දක්වා ඩී.ජී.එස්.ඒ 2 සිට ඩී.ජී.එස්.ඒ 10 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 19 සිට 22 දක්වා ඇතුළත් අනෙකුත් විස්තර ද මෙම විසර්ජන ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. එබැවින් ඉහත ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් තොරතුරු හා සටහන්වලට අනුකූලව පිළියෙල කර ඇති බවත්, භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ අදාළ ගිණුම් සැසඳීම් කර ඇති බවත්, ඒවා නිවැරදි බවට තහවුරු වී ඇති බවත් මෙයින් සහතික කරමි.

| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | | ගණන්දීමේ නිලධාරි | | ගණකාධිකාරී | |
|---|---|---|---|---|---|
| නම: | එස්.අබේසිංහ | නම: | - | නම: | ඩබ්ලිව්.ඩබ්ලිව්.ඩබ්ලිව්.ඩී.එස්. ප්‍රනාන්දු |
| තනතුර: | අමාත්‍ය මණ්ඩලයේ ලේකම් | තනතුර: | - | දිනය: | 2018.03. 29 |
| දිනය: | 2018.03. 29 | දිනය: | - | | |

ඩබ්ලිව්.ඩබ්ලිව්.ඩබ්ලිව්.ඩී.එස්. ප්‍රනාන්දු
ගණකාධිකාරී
අමාත්‍ය මණ්ඩල කාර්යාලය
ජනරජ චතුරශ්‍රය
කොළඹ 01.

1

ඇමුණුම IV

ඇමුණුම 1

**මු.රෙ. 506 (ඩී) ප්‍රකාර රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම**

**2017.12.31 දිනට වාර්ෂික සැසඳුම් ප්‍රකාශය**

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/දි.ලේ. කර්යාලය: අමාත්‍ය මණ්ඩල කාර්යාලය

ගිණුම් අංකය : 00501

| සීමාවන් | වියදම් උපරිම සීමාව<br>රු | අවම ලැබීම් සීමාව<br>රු | උපරිම හර ශේෂ සීමාව<br>රු |
|---|---|---|---|
| 1.1 විසර්ජන පනතින් බලය දෙනු ලැබූ | 3,500,000.00 | 2,300,000.00 | 25,000,000.00 |
| 1.2 වර්ෂය තුල අනුමත ප්‍රතිශෝධිත | - | - | - |

| කරුණ | වියදම (හර)<br>රු | ලැබීම් (බැර)<br>රු | හර ශේෂය<br>රු |
|---|---|---|---|
| 2. වර්ෂය අවසානයේ තත්‍ය අගයන් (භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත පරිදි) | | | |
| 2.1 මුදලින් (11) | 3,353,121.00 | 2,743,525.00 | 9,968,142.87 |
| 2.2 හරස් සටහන් (12) | 345,559.00 | 728,029.00 | (382,470.00) |
| 3. තත්‍ය අගයන් තුල ඇතුලත් මු.රෙ.503(1) යටතේ ගැලපුම් | | | |
| 3.1 මුදලින් (11) | - | - | - |
| 3.2 හරස් සටහන් (12) | - | - | - |
| (මු.රෙ.503(1) යටතේ සිදු වූ ගැළපුමක් බව හඳුනාගැනීම සඳහා ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් කළ යුතුය - ඇමුණුම 1.1) | | | |
| 4 මු.රෙ.503(1) යටතේ ගැලපුම් ඉවත් කළ පසු තත්‍ය අගයන් [02-03] | | | |
| 4.1 මුදලින් (11) | 3,353,121.00 | 2,743,525.00 | 9,968,142.87 |
| 4.2 හරස් සටහන් (12) | 345,559.00 | 728,029.00 | (382,470.00) |
| 5. සීමා ඉක්මවීමක්/පහත වැටීමක් සිදු වී ඇත්නම් එම වටිනාකම (1.1 හා 1.2 අගයන් 4.1 සමඟ සැසඳීමෙන්) | - | - | - |

| | | | |
|---|---|---|---|
| ගණකාධිකාරී | | ගණන්දීමේ නිලධාරී | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී |
| නම :- | ඩබ්ලිව්.ඩබ්ලිව්.ඩබ්ලිව්.ඩී.එස්. ප්‍රනාන්දු | නම :- - | නම :- එස්. අබේසිංහ |
| තනතුර :- | ගණකාධිකාරී | තනතුර :- - | තනතුර :- අමාත්‍ය මණ්ඩලයේ ලේකම් |
| දිනය :- | 2018.04. 24 . | දිනය :- - | දිනය :- 2018.04 .24 |

ඩබ්ලිව්.ඩබ්ලිව්.ඩබ්ලිව්.ඩී.එස්. ප්‍රනාන්දු
ගණකාධිකාරී
අමාත්‍ය මණ්ඩල කාර්යාලය
ජනරජ චතුරශ්‍රය
කොළඹ 01.

එස්. අබේසිංහ
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්,
අමාත්‍ය මණ්ඩල කාර්යාලය,
ජනරජ චතුරශ්‍රය,

1